ක්ලෝනකරණය


# රූවට රූවක් කයට කයක්



මුළු ලොවම
බියෙන් තැතිගැන්වූ
හිට්ලර්ට නැවත පණ
ලැබුණොත් ? එය විහිළුවක් පමණක්
යැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන.
එහෙත් එය තවදුරටත් විහිළුවක් හෝ සිහිනයක් හෝ
පමණක් නොවේ. ක්ලෝනකරණ තාක්ෂණයේ දියුණුව කෙතෙක් ද
කිවහොත් මීට දශක ගණනකට පෙර මියගිය හිට්ලර්ට යළි පණ ලබාදෙන්නට
බැරිකමක් නැත. ඒ සඳහා එකම අවශ්‍යතාව හිට්ලර්ගේ ජාන සුරැකිව තිබීම පමණි.

මොහොතකට මෙසේ සිතන්න. ඔබේ දියණියට ඇටමිදුළු බද්ධයක් කිරීමට අවශ්‍යව ඇත. එහෙත් ඒ සඳහා අවශ්‍ය කොටස් ලබාගන්නට ගැලපෙන කෙනෙකු සොයාගන්නට ඔබ අපොහොසත් ය. ඉතිං ඔබට සිදුවන්නේ හඬා වැළපෙමින් දෙවියන්ට යාච්ඤා කරන්නට නොවේ ද? ඔබේ බිරිඳ ආර්ථවාභාවයට මුහුණ දී ඇති නිසා ඔබට වෙනත් දරුවකු අපේක්ෂා කරන්නට නොහැකි වී ඇතැයි සිතන්න. එවිට ඔබට ඔබේම දරුවකු ගැන බලාපෙරොත්තු අත්හරින්නට සිදුවනවා නොවේ ද?? නැතහොත් ඔබේ පස් හැවිරිදි දරුවා දියේ ගිලී මියගියා යැයි සිතන්න. ඔහු මියගියා යැයි සිතන්නට ඔබ කැමති නැත. ඔහුවම ඔබට අවශ්‍ය ය. ඔහුගේ මුහුණ යළිත් සජීවීව දකගන්නට ඔබට වුවමනා ය. ඔබට වුවමනා වෙනත් දරුවකු නොව කලින් සිටි දරුවාම ය. ඔබට එය කළ හැකි ද? ඇත්තෙන්ම කළ හැකි ය. ක්ලෝනකරණ තාක්ෂණය ඔබේ පිහිටට එයි.

එහෙත් එය ඔබ සිතනා තරම් සරල ක්‍රියාදාමයක් නොවේ. විද්‍යාත්මක වශයෙන් නිරාකරණය නොවූ ගැටලු රැසක් ම තවමත් මේ ක්ෂේත්‍රයේ පවතී. එක් අතකින් බලන කල



පිළිකා ප්‍රතිකාර හේතුකොට ගෙන වඳබවට පත් වූ ඩොනර් සිය බිරිඳ නැන්සි සමඟ (ඔවුන්ගේ දූත් බලාපෙරොත්තුව ක්ලොනකරණයේ පිහිට ලබා ගැනීම ය.)



ක්ලෝනකරණයෙන් දරුවකු පතන ඩිෂැසෝ තෝමස් යුවළ



කලින් ආර්ථවාභාවයට ලක්වූ සැබීෆ්ගේ දූත් බලාපොරොත්තුව ද ක්ලෝනකරණයේ පිහිට පැතීම ය.

# කොපිඩෝග් හා කොපිකැට්



ඇමරිකාවේ ටෙක්සාස් හි මාක් වෙස්තුසියන්ගේ දුරකථනයට නිවනක් තිබුණේ නැත. මාක් වෙස්තුසියන් ටෙක්සාස් හි A3M සරසවියේ ක්ලෝන විද්‍යාඥයෙකි. ඔහු දිගුකලක් තිස්සේ මේ ක්ලොනකරණ පර්යේෂණවල නිරතව ඇති අතර මේ දිනවල ඔහු උත්සහ කරමින් සිටින්නේ 13 වියැති මිසි නම් බලු සුරතලා ක්ලෝන කිරීමට ය. මේ වනතුරු ඒ උත්සාහය සාර්ථක වී නැතත් බල්ලන්ගේ ජාන ක්‍රියාවලට අදාළ වැදගත් තොරතුරු රැසක් හෙළි වී ඇත.

බල්ලන් බළලුන් වැනි සුරතලුන් ක්ලෝන කිරීම ගැන මිනිසුන්ගේ අවධානය වර්ධනය වූවේ 1997 දී ඩොලී ක්ලෝන කිරීමෙන් පසුව ය.

"හුඟක් මිනිසුන්ට තමුන්ගේ සුරතලුන් ක්ලොන කර ගන්න වුවමනායි. පූසන්, බල්ලන්, අශ්වයන්, ගවයන් වැනි සතුන් තමා එහෙම ක්ලෝන කරන්න බලාපොරොත්තු වෙන්නෙ. ගෙවිය යුතු මිල සාධාරණ එකක් නම් ඔවුන් මේ කටයුත්ත කරන්න කැමතියි."

මිසිගේ පර්යේෂණ සඳහා ආයෝජනය කොට ඇති මුදල ඩොලර් මිලියන 3.7 කට අධික ය.

සුරතල් සතුන් ක්ලෝනකරණයේ දී විශේෂයෙන් බලු සුරතලුන් ක්ලෝනකරණයේ දී විද්‍යාඥයන් මුහුණ දෙන බරපතලම ගැටලුව බීජ ලබා ගැනීමයි. බල්ලන්ගේ ප්‍රජනන කාලය මාස හයෙන් හයට එන්නකි.

වෙස්තුසියන්ට අනුව නම් මේ බල්ලන් ක්ලෝනකරණය එතරම් පහසු දෙයක් නොවේ. ක්ලෝනකරණයෙන් බිහිවන සතුන් නොවැඩුන පෙනහළු සහිත වුවත් වීමට හෝ වෙනත් එවැනි විකෘති ඇත්තවුත් වීමට ඉඩ තිබෙතැයි ඔහු කියයි. "ඇයි අපි දන්නම මිනිසුන් ක්ලෝන කරන්න ඉක්මන් වෙන්නෙ. අපට තවම හරියට සතුන් ක්ලෝන කරන්නත් බැරිව ඉද්දී"

ඒ ඔහුගේ අදහස ය.

ඒවා ජයගැනීම පහසු ය. වඩාත්ම බරපතල මේ කරුණ අරබයා ඇති සදචාරාත්මක ගැටලු ය. මානව ක්ලෝනකරණය අරබයා මතුව ඇති සදචාරාත්මක ගැටලුවල නව ප්‍රවණතා ගැන අපූර්ව තොරතුරු රැසක් ගැන ටයිම් සඟරාවේ නැන්සි ගිබ්ස්ගේ ලිපියකින් කියවිණි.

නැන්සි ගිබ්ස්ගේ ලිපියට අනුව නම් දකුණු කොරියාවේ පර්යේෂකයන් කණ්ඩායමක් දැනටමත් මානව කළලයක් ක්ලෝනකරණය කොට ඇත. එහෙත් ඔවුන් එය වර්ධනය නොකොට විනාශ කර දමා ඇත.

පසුගිය මාසයේ දී කෙන්ටකි සරසවියේ පැනයිසෑටිස් ෂවොස් හා ඉතාලි ජාතික පර්යේෂකයකු වන සර්වෙතියෝ ඇන්ටිනොයිරි පවසා සිටියේ තමන් පළමු මානව ක්ලෝනය කළ බව ය. ඔවුන් එය කර ඇත්තේ මීට වසර හතකට පෙර ය. අවුරුදු හැට දෙකක් වයසැති කාන්තාවකට දයක ඩිම්බ මගින් දරුවකු ලබාදීමට ඔවුන් සමත් වී තිබේ.

නිව්යෝක් ටයිම්ස් හා වයර්ඩ් සඟරාවල ද මේ ක්ලෝනකරණය ගැන නවතම වාර්තා පළවී තිබේ. ඒවායින් කියවුණේ රේලියන්ස(Raelians)නම් ආගමික කණ්ඩායමක් (නිකායක්) මියගිය දසමස් වයසැති දරුවකුගේ සෛලවලින් ක්ලෝනකරණ තාක්ෂණයේ පිහිටෙන් අලුත් දරුවකු ලබා ගත් පුවතකි. මේ ආගමික කණ්ඩායම සතුව උසස් දැනුමැති විද්‍යාඥයන් සිටිනා බව ද ඊට අමතරව ඉහළ මට්ටමේ විද්‍යාගාර ඔවුන් සතු බව ද කියනු ලැබේ. ක්ලෝනකරණය කළ දරුවා වර්ධනය කර ගැනීම සඳහා ඔවුන් පනස් හැවිරිදි කිරි අම්මා කෙනෙකු ද තෝරාගෙන ඇත.

ඩොලීගේ අන්දකීමෙන් පසු බොහෝ දෙනා වටහා ගත්තේ ක්ලෝනකරණය ඉතාමත් පහසු දෙයක් බව ය. කළයුත්තේ දයක බීජ ලබාගැනීමත් ඒවා සමගDNAසම්බන්ධ කරවීමත් පමණකි. උදහරණයක් දක්වතොත් කෙනෙකුගේ හමේ සෛලයකින් තවත් එවැනි පුද්ගලයකු බිහිකළ හැකි ය.

ක්ලෝනකරණ ක්‍රමයෙන් සම්පූර්ණ පුද්ගලයන් බිහි කිරීමට පමණක් නොව අදාළ කොටස්වල සෛල උපයෝගී කරගෙන හෘදය, අක්මා වැනි අවයව නිෂ්පාදනය කරන්නටත් විද්‍යාඥයෝ බලාපොරොත්තු වෙති. මෙහිදී නිෂ්පාදනය යන වචනය යෙදුවේ වැරදීමකින් නොවේ.

එය ඇත්තෙන්ම ආර්ථික වටිනාකමක් ඇති නිෂ්පාදනයක් වන හෙයිනි.

එක් එක් සුප්‍රකට පුද්ගලයන් ක්ලෝනකරණය ගැන දක්වන අදහස් ගැන ද නැන්සි ගිබ්ස්ගේ ලිපියේ සඳහන් ව තිබේ.

නිව්යෝක් නගරයේ ව්‍යාපාරිකයකු වන 63 හැවිරිදි රැන්ඩොල්ප් විකර් තමාගේ සෛල කිපයක් ගබඩා කොට තබා ඇත්තේ අනාගතයේදී ක්ලෝන කිරීම සඳහා ය.

"මං මැරෙන්න ඉස්සරවෙලා මේ ක්ලෝනකරණය කරන්න බැරි වුණොත් මැරුනට පස්සෙ හරි ඒ දේ කරවන්නයි මගෙ වුවමනාව. ඒ විතරක් නොවෙයි මගෙන් පස්සෙ මගෙ දේපළ අයත් වෙන්න ඕනෙ ඒ ක්ලෝනයට" ඔහු එසේ කියයි.

එහෙත් ඔහුට මේ අභිප්‍රාය ඉටුකර ගැනීමට උදව් කරන්නට කැමැති නීතිඥයකු තවමත් හමුවී නැත. ඔහු නීතිඥයන් කීප දෙනෙකු හමුවී තම අවශ්‍යතාව කියා සිටියද ඒ කිසිවකු මේ නිශ්චිත නොවන අන්තිම කැමැත්ත ලිවීමට එකඟ වී නැත.



මැට් රකුවර්ගේ හා ඩෙසරි බෝන්ගේ බලාපොරොත්තුව ද ක්ලෝනකරණයමය



මියගිය පුතාගෙන් පටක ලබාගෙන පවුලේ අයගේ අනාගත අවශ්‍යතා සඳහා (බද්ධ කිරීම්) යොද ගැනීමට මැරියන් මුවෙමික් බලාපොරොත්තු වේ




ක්‍රිස්ටි සිල්වාගේ බලාපොරොත්තුව දියවැඩියාවෙන් පෙළෙන තම පුතුට ක්ලෝනකරණයේ පිහිටෙන් වකුගඩු ලබා දීමය.

සමලිංගිකයකු වන විකර් තමාට කෙළින්ම දරුවකු ලබා ගන්නට නොහැකිවීම ගැන කනගාටුවෙන් සිටින්නෙකි. වයසට යත්ම ඔහුගේ මේ සම්බන්ධ කනගාටුව මෙන්ම දරුවකු ලබා ගැනීමේ උවමනාව ද වර්ධනය වෙමින් පවතී. තමාගේ ක්ලෝනයේ තිබිය යුතු ලක්ෂණ පවා ඔහු කියා සිටී.

"එයා තිල් පාටට කැමති වෙන්න ඕනෙ. මධ්‍යධරණී කෑමවලටත් ස්පාඤ්ඤ රොමැන්ටික් සංගීතයටත් ආසා කරන කෙනෙක් වෙන්න ඕනෙ" ඔහු කියයි.

"එතකොට මට පුළුවන් මාරයට කථාකරල කියන්න මේ මාරයෝ උඹට පුළුවන් වෙයි මා ගන්න. හැබැයි උඹට මගේ ඔක්කොම ගන්න බැහැ. මගෙ යමක් ඉතුරු කරල යන්නෙ."

ඔහු තමාගේ මරණයෙන් පසුවත්, තමාගේ ශරීර ව්‍යූහයේ කොටසකින් සැදුණ සුවිශේෂ ජීවියෙක් ලොව තුළ පැවතීම ගැන දැඩි ලෙස සතුටු වන්නෙකි. එලෙස බලන කල අවශ්‍ය නම් කෙනෙකුට දිගින් දිගටම ජීවත් විය හැකි නොවේ ද? අප තුළ එවැනි



ක්ලෝනකරණය ගැන වෙබ් අඩවි පවත්වාගෙන යන විකර්

සිතිවිලි පහළවීමට ඉඩ තිබේ. එහෙත් ඒ ගැන සදාචාර ධර්මවාදියකු වන පෙතිසිල්වේනියා සරසවියේ ආතර් කප්ලාන් කියන්නේ මෙවැන්නකි.

"ඔබට මේ ක්‍රමයෙන් සදාකාල ජීවිතයට ඇතුළත් වන්නට බැහැ. ඔබට ක්ලෝනකරණය මගින් අමරණීය වන්නට බැහැ. ක්ලෝනකරණයෙන් බිහිවන්නේ කලින් හිටි කෙනා නෙමෙයි. සම්පූර්ණ වෙනස් පුද්ගලයෙක්. නිවුන්නු දෙන්නෙක් ගැන හිතන්න එක් අයකුට වෙඩි තැබුවාම එයාට වේදනාව දැනෙනව. අනෙකාට කිසිම ගණනක් නැහැ ඒ වගේ තමයි"

රෝමානු කතෝලික පල්ලියේ අදහස් ද මේ සම්බන්ධයෙන් වැදගත් ය. මිනිසා මවනු ලැබුවේ දෙවියන් විසින් යැයි කතෝලිකයෝ අදහති. දෙවියන්ගේ මැවීමේ කාර්යයට මිනිසා අතගැසීම ගැන කතෝලික පල්ලියේ ඇත්තේ නොකැමැත්තකි. දෙවියන්ගේ ආදරයේ තිළිණයක් වන මිනිස් ජීවිතය කර්මාන්තමය නිෂ්පාදනයක් විය යුතු ද යන ගුණය එහිදී පැන නගී.


කතෝලික විශ්වාසය අනුව ආත්මය ශරීරයට ඇතුළු වන්නේ පිළිසිඳ ගැනීම සිදුවන වේලාවේදී ය. එලෙස බලන කල දෙවියන්ට ද අවශ්‍ය පරිදි ඒ වෙලාවේදී ක්ලෝනකරණය සිදු කළ හැකි ය. දිනකට සම තිඹුල්ලුන් 4000 ක් පමණ ලොව උපදී. එනිසා දෙවියන්වහන්සේ ද ඉතා කාර්යක්ෂම ලෙස ක්ලෝනකරණයේ යෙදෙන බව උපකල්පනය කළ හැකි ය. මන්දයත් පැය 24 කට 4000 ක් යනු විශාල වේගයකි. දෙවියන් වහන්සේ කරන (හෝ ස්වභාවිකව සිදුවන) දෙයට මිනිසා අත පෙවීම සුදුසු ද යන්න ආගමික සදාචාරයට බලපාන ගැටලුවකි. ආගමික ආයතන, දේශපාලනඥයන් වැනි අය සාරධර්ම ගැන සිතමින් ක්ලෝනකරණයේ දෙස් දුටුව ද ක්ලෝනකරණයේ පිහිට පතන අයට ඒ සඳහා දීමට උත්තර තිබේ. අප කලින් සඳහන් කළ ෂාවොස් ඒ ගැන මෙසේ කියයි.

"සාරධර්ම කියන්නේ පුදුම වචනයක්. ඒක මෙතනට යොදා ගන්න බැහැ. අපට මෙතන කාර්යයක් තියෙනවා. අපට අපි වගේම කෙනෙකු ඕනෙ. ඒක අපගෙ අයිතියක්. ජීවන චක්‍රය සම්පූර්ණ කරන්න අපට මේ දේ අවශ්‍යයි."

ඔල්ගා ටොමුස්යක් යනු සිඩ්නි නුවර විසූ පරිගණක වැඩසටහන් නිෂ්පාදිකාවක වන ටානියාගේ එකම දියණියයි.

ඔල්ගා ඇගේ හත්වන උපන්දිනය ද උඩතට්ටුවේ ජනේලයකින් වැටී මිය ගියා ය. දියණිය නැති ජීවිතය මේ මවටත් පියාටත් සොහොන්බිමක ගතකරන්නක් බඳු විය. ඒ මරණය අවස්ථාවේ දී ඔල්ගා ගේ

## මිනිසකු ක්ලෝන කරන්නේ කෙසේ ද?



# මගේ සහෝදරිය මගේ ක්ලෝනය යි



මට ද ක්ලෝනයක් තිබේ. ඒ මගේ සහෝදරිය ඩයනා ය. අපි සම නිඹුල්ලු වෙමු. ඩයනාගේ කොණ්ඩය රත්වන් ය. හම පැහැපත් ය. ඇගේ කටහඬ මගේ කටහඬට සමාන ය. අපි දෙදෙනා ම තවම අවිවාහක වෙමු. දෙදෙනාම කියවීමටත් මෙක්සිකානු ආහාරවලටත් කැමැත්තෙමු.

අපි දෙදෙනාගේ පියාට ද නිවුන් සහෝදරයකු සිට ඇත. පියාගේ ඒ නිවුන් සහෝදරයා වන ප්‍රැන්සිස්ට නිවුන් දියණියන් සිටියේ ය.


නිවුන් සහෝදර සහෝදරියන්ට ඔවුනොවුන්ගේ හැසිරීම් රටා ගැන අවබෝධයක් අන්‍යෝන්‍ය හැඟීම් දැනීම් වැටහෙන බව සැබෑවකි. අපට ද ඒ අත්දැකීම් ඇත. අප දෙදෙනා වෙනත් නගරවල ජීවත් වෙද්දී පවා බොහෝ විට ඇඳ ඇත්තේ එකම වර්ගයේ ඇඳුම් ය. අප හඳුනන වෛද්‍යවෘත්තියේ නියැලි නිවුන්නුන් දෙදෙනකු සිටිති. ඔවුන් විභාගයේ දී ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියන විට හැමවිටම අතහැර තිබුනේ එකම වර්ගයේ ප්‍රශ්නයන් ය. මේ විදිහේ සමානතාවක් තිබුන ද අපි හැම අතින්ම එකිනෙකාට සමාන නොවෙමු. අපේ සිතිවිලි වෙනස් ය. එයට හේතුව අප වෙනස් ආත්ම ඇත්තවුන් වීම ය. ඔබට පුද්ගලයකු ක්ලෝන කළ හැකි ය. එහෙත් ආත්මය ක්ලෝන කළ නොහැකි ය.

මේ පිංතූරයේ සිටින්නේ මේ ලිපිය ලිවූ සුසාන් රිඩ් හා ඇගේ නිවුන් සොයුරිය යි.

දෙමව්පියන් ක්ලෝනකරණය ගැන දැන සිටියේ නැත. එනිසාම ඔවුහු ඇගේ සිරුර ආදහනය කළහ. ක්ලෝනකරණය ගැන දැන ගන්නා විට ඔවුනට සිදුවූවේ කණගාටු වන්නට ය. සිරුර භූමදානය කළා නම් එහි කොටසක් ගෙන ක්ලොන්කරණය කරන්නට තිබුණා නොවේදැයි ඔවුනට සිතිණි. එහෙත් ඔවුනට බලාපෙරොත්තු බිඳගන්නට සිදුවූවේ නැත.

දියණියගේ කෙස් ටිකක් හා දත් තුනක් ඔවුන් වෙත ඉතිරිව තිබිණි. සෛද්ධාන්තිකව දත්වලින් DNA ලබාගෙන ක්ලොනකරණය කළ හැකි ය.

"බබා ඔල්ගා වගේම වෙයි කියා බලාපොරොත්තු වෙන්න බැහැ. ඒත් තරමක් හෝ සමාන වෙයි කියා මං විශ්වාස කරනව" ඔල්ගාගේ මව ටානියා කියයි. ටානියා හා ඇගේ සැමියා තවමත් තරුණ වියේ පසුවන්නෝ ය. ඔවුන්ට වෙන දරුවන් ලබාගැනීමේ හැකියාවක් ද පවතී.



එහෙත් අවශ්‍යව ඇත්තේ මේ ක්ලෝන දරුවා පමණි.

ක්ලෝනකරණයේ සදචාරමය ගැටලු ගැන සලකා බලද්දී ක්ලොන් අයිතිය පවතින්නේ කාටද යන්නත් ලොකු ගැටලුවකි. ක්ලෝනකරණයට සෙල ලබාගන්නා කෙනාට ද නැතහොත් බිහිවන ක්ලෝනයට ද?

තමා ගැන තීරණ ගන්නට ක්ලෝනකරණය ලක්වන්නාට ඉඩ තිබේ ද? මේ ගැටලු තවමත් විසඳී නැත්තේ ඒ පිළිබඳ නීති ගොඩ නැගී නැති හෙයිනි. විවාහක මව්පිය දෙදෙනකුට ක්ලෝන දරුවකු ලැබුණා යැයි සිතන්න. එසේම කිසියම් හේතුවක් නිසා ඔවුනට දික්කසාද වන්නට සිදුවූවා යැයිද සිතන්න. ක්ලෝන දරුවා ලබා ගත්තේ තාත්තාගෙන් නම් දරුවාට ඇත්තේ ඔහුගේ මුහුණුවර ය.

නීතියෙන් මේ පුතා මවට හිමිවුවොත් ඇය ඔහු හදවඩා ගත්තේ කෙලෙස ද? තමා වෛර කරනා පුද්ගලයකු සමග දිගුකාලයක් ජීවත් වන්නට නොවේද ඇයට සිදු වන්නේ.

දකුණු කැලිපෝනියාවේ බිල්ගේ ගැටලුව මීට වෙනස් එකකි. ඔහුට වුවමනා දනට ජීවත්වන, පිළිකාවකින් පීඩා විඳින තම මව ක්ලෝනකරණයට බඳුන් කරන්නට ය. එහෙත් ඔහු තවමත් මේ ගැන මවට කියා නැත. එය හෙළිවීමෙන් ඇය කම්පනයට පත්වෙතැයි ඔහු බිය වී සිටී. මන්දයත් තමත් ඇය පිළිබඳ බලාපොරොත්තු අත්හැර ඇතැයි කියා අම්මා සිතනු ඇත.

භයානක ආසාත්මික රෝගයකින් හා ඇදුමෙන් පීඩා විඳින ජැක් බේකර් සිතන්නේ තමා ජීවත් වෙද්දීම තමාගේ ක්ලෝනයක් බිහි කරන්නට ය. එහෙත් තමාගේ ඇති රෝගයන්ගෙන් නිදහස් ක්ලෝනයකි, ඔහුට අවශ්‍යව ඇත්තේ.

ක්ලෝනකරණ ප්‍රවණතා අවධානයට යොමු කළ ටෙක්සාස් හි කතෝලික බලධාරීන් පසුගිය මාසයේ හදිසි රැස්වීමක් කැඳවීම ද සුවිශේෂ සිද්ධියකි. කාදිනල්වරුන් පස්දෙනෙක් හා බිෂොප්වරුන් 160 ක් මේ රහසිගත සාකච්ඡාවට සහභාගි වූහ.

කතෝලික පල්ලියේ ක්ලොන්කරණ විරෝධය සාධාරණ ද යන ගැටලුව දැන් කතෝලිකයන් තුළම පැන නැගී තිබේ. බයිබලයේ කියා ඇත්තේ "එල දරන්න" කියා ය. එල දැරීමට ගන්නා මේ උත්සාහයට පල්ලිය විරෝධය දැක්වීම සාධාරණ ද? විද්‍යාඥයන් කරන්නේ මැවීමක් නොව දෙවියන් දී ඇති ද්‍රව්‍ය හරහා යම් දෙයක් නිපදවීම පමණක් නොවේ ද?

**කතෝලික පල්ලියේ ක්ලොන්කරණ විරෝධය සාධාරණ ද යන ගැටලුව දැන් කතෝලිකයන් තුළම පැන නැගී තිබේ. බයිබලයේ කියා ඇත්තේ "එල දරන්න" කියා ය. එල දැරීමට ගන්නා මේ උත්සාහයට පල්ලිය විරෝධය දැක්වීම සාධාරණ ද? විද්‍යාඥයන් කරන්නේ මැවීමක් නොව දෙවියන් දී ඇති ද්‍රව්‍ය හරහා යම් දෙයක් නිපදවීම පමණක් නොවේ ද?**

හෘදය නැවතුන විට වෛද්‍යවරුන් කරන්නේ එය පණ ගැන්වීම නොවේ ද? ක්ලෝනකරණයට විරුද්ධ වෙනවා නම් එසේ නැවතුන හදවතට පණ දීමටත් විරුද්ධ විය යුතු නොවේ ද?

ක්ලෝනකරණයට විරෝධතා මතුවන්නේ ආගමික සංස්ථා තුළින් පමණක් නොවේ. උදහරණයක් දක්වතොත් ඇමරිකාවේ කැලිපෝනියා, ලුසියාන, මිචිගන්, රෝඩ් දූපත් යන ප්‍රාන්තවල මානව ක්ලෝනකරණය තහනම් ය. ටෙක්සාස් වල ද ළඟදීම මේ තහනම ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

සාරධර්මවේදී කප්ලාන් කියන්නේ මුළු ලොව පුරා මේ තහනම ක්‍රියාත්මක කළ යුතු බව ය.

"ක්ලෝනකරණ ගැටලුවට එකම විසඳුම මානව ක්ලෝනකරණයේ යෙදෙන කෙනෙකු අදම අත්අඩංගුවට ගැනීමයි" ඒ ඔහුගේ විසඳුම ය.

එහෙත් ඒ විසඳුම ප්‍රායෝගික එකක් ද? මුළු ලොවම මේ දෙස බලා සිටී. ❑